(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **45.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 ජනවාරි 05 අඟහරුවාදා පූ.භා. 10.00** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** සෞඛ්‍ය අමාත්‍යතුමිය

ගරු **විමල් වීරවංශ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගම්ලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍යකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, එළුණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු  අමරකීර්ති අතුකෝරළ මහතා

ගරු  තලතා අතුකෝරල මහත්මිය

ගරු  සම්පත් අතුකෝරල මහතා

ගරු  තිස්ස අත්තනායක මහතා

ගරු  හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු  අශෝක් අබේසිංහ මහතා

ගරු  (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු  තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු  මායාදුන්න චින්තක අමල් මහතා

ගරු  තවරාජා කලෙයි අරසන් මහතා

ගරු  ජේ. සී. අලවතුවල මහතා

ගරු  ටිරාන් අලස් මහතා

ගරු  තිසකුට්ටි ආරච්චි මහතා

ගරු  එම්. උදයකුමාර් මහතා

ගරු  යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු  (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු  සංජීව එදිරිමාන්න මහතා

ගරු  අකිල එල්ලාවල මහතා

ගරු  ලලිත් එල්ලාවල මහතා

ගරු  සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු  ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු  ගයන්ත කරුණාතිලක මහතා

ගරු  සාගර කාරියවසම් මහතා

ගරු  ෆයිසාල් කාසිම් මහතා

ගරු  ජයන්ත කැටගොඩ මහතා

ගරු  ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු  උදයන කිරිඳිගොඩ මහතා

ගරු  ජගත් කුමාර මහතා

ගරු  ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු  ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු  කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

**ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු මහින්ද සමරසිංහ මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාදීම හෝ දිවුරුම්දීම :** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ තෝරා පත් කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි නීති ප්‍රකාර ප්‍රතිඥා දී සභා මේසය මත තබා ඇති පොතෙහි අත්සන් කළේය.

**2. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශය :** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2020 දෙසැම්බර් මස 17 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුවට වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

**ගෝඨාභය රාජපක්ෂ**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு**
**Democratic Socialist Republic of Sri Lanka**

**3. කථානායකවරයාගේ නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, 2020 දෙසැම්බර් මස 10 වන දින මවිසින් 'විසර්ජන' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**4. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VIII, IX සහ X කොටස් ද, තෙවැනි කාණ්ඩයේ VI කොටස ද සහ නවවැනි කාණ්ඩයේ IV කොටස ද ඉදිරිපත් කරන ලදී

එම වාර්තා, **සභා මේසය** මත තිබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(1) 2016 වර්ෂය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන; සහ

(2) 2018 වර්ෂය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන

ඉදිරිපත් කර එම වාර්තා, මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2017 සහ 2018 වර්ෂ සඳහා රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර එම වාර්තා, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(4) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2020 දෙසැම්බර් 30 දිනැති අංක 2208/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 අගෝස්තු 14 දිනැති අංක 2188/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 අගෝස්තු 21 දිනැති අංක 2189/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 සැප්තැම්බර් 03 දිනැති අංක 2191/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 සැප්තැම්බර් 30 දිනැති අංක 2195/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 13 දිනැති අංක 2197/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 2199/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(vii) රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධ යෝජනාව (2020 සැප්තැම්බර් 21 දිනැති අංක 2194/5 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

පිළිගන්වා එම ලිපිලේඛනාදිය, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(6) මහාමාර්ග අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(7) කම්කරු අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(8) මහාමාර්ග අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(9) අධ්‍යාපන අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(ii) 2018 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

ඉදිරිපත් කර එම වාර්තා, අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

(10) සෞඛ්‍ය අමාත්‍යවරිය විසින් 2017 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කර එම වාර්තාව, සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

(11) රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

(12) කර්මාන්ත අමාත්‍යවරයා විසින් —

(i) 2015/2016 සහ 2016/2017 වර්ෂ සඳහා ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තා;

(ii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(iv) 2018/2019 වර්ෂය සඳහා සීමාසහිත ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

(13) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

(14) මහාමාර්ග අමාත්‍යවරයා විසින් —

(i) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්; සහ

(ii) 2018 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ඉදිරිපත් කර එම වාර්තා, සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

**5. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ);

(ii) ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ;

(iii) අවම වේතන (ඉන්දියානු කම්කරු); සහ

(iv) කර්මාන්තශාලා නමැති සංශෝධන පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

**6. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) (i) කොළඹ 10, පන්සල පාර, අංක 223 දරන ස්ථානයෙහි පදිංචි පී. එම්. විජේතුංග මහතාගෙන් හා තවත් අයෙකුගෙන් ලැබුණු 2020.08.24 දිනැති පෙත්සම;

(ii) බියගම, බණ්ඩාරවත්ත, වීරසේකර පෙදෙස, අංක 169/1 ඒ දරන ස්ථානයෙහි පදිංචි පී. යූ. ඩී. පෙරේරා මහතාගෙන් ලැබුණු 2020.09.08 දිනැති පෙත්සම; සහ

(iii) කුණ්ඩසාලේ, පල්ලෙකැලේ, ට්‍රිනිටි ගාර්ඩන්ස්, අංක 04 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එම්. පී. කේ. රත්නායක මහතාගෙන් ලැබුණු 2020.08.20 දිනැති පෙත්සම

ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(2) පදවිය, නව නගරය යන ලිපිනයෙහි පදිංචි ඒ. චමින්ද කැලුම් අබේසේකර මහතාගෙන් ලැබුණු 2020.09.28 දිනැති පෙත්සම ගරු එච්. නන්දසේන මහතා විසින් පිළිගන්වන ලදී.

(3) බුත්තල, උඩගම, දුටුගැමුණු පාසල් මාවත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. නන්දසේන මහතාගෙන් ලැබුණු 2020.09.20 දිනැති පෙත්සම ගරු ගයාෂාන් නවනන්ද මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) පානදුර, පින්වත්ත, කීල්ස් නිවාස, අංක 46 දරන ස්ථානයෙහි පදිංචි ජී. ඩී. ෆ්‍රැන්සිස් මහතාගෙන් ලැබුණු 2020.11.27 දිනැති පෙත්සම; සහ

(ii) මතුගම, ආදාගල පාර, අංක 219/ඒ දරන ස්ථානයෙහි පදිංචි ආර්. පී. ඩී. ප්‍රභාවි සචින්තනා රණවීර මෙනවියගෙන් ලැබුණු 2020.10.22 දිනැති පෙත්සම

ගරු අනුප පස්කුවල් මහතා විසින් පිළිගන්වන ලදී.

(5) නවගත්තේගම, වෙලේවැව, අංක 56 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එච්. එම්. එන්. රාජකරුණා මහතාගෙන් ලැබුණු 2020.11.27 දිනැති පෙත්සම ගරු මායාදුන්න චින්තක අමල් මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) රාජගිරිය, තිස්සපොල්දුව මාවත, මැදවැලිකඩ, 1 පටුමඟ, අංක 47/31 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එස්. අධිකාරම් මහතාගෙන් ලැබුණු 2020.10.19 දිනැති පෙත්සම; සහ

(ii) කොට්ටාව, මාළඹේ පාර, අංක 726 දරන ස්ථානයෙහි පදිංචි පී. පී. ජී. මයිකල් මහතාගෙන් ලැබුණු 2020.09.23 දිනැති පෙත්සම

ගරු මධුර විතානගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(7) දිගාමඩුල්ල - වීරගොඩ, රජගම, අංක 8/37 දරන ස්ථානයෙහි පදිංචි එල්. ජී. එන්. සමන් විජේනාත් මහතාගෙන් ලැබුණු 2020.11.06 දිනැති පෙත්සම ගරු ඩී. වීරසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**7. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ජගත් පුෂ්පකුමාර මහතා, ගරු සංජීව එදිරිමාන්න මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**8. සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතුයැයි"කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ.භා. 12.08 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි සංචාරක අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.19 ට ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වැවිලි අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.29 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.12 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනිවර කියවිය යුතු ය"යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනිවර කියවා සම්මත කරන ලදී.

**9. ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සිට 8 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනිවර කියවිය යුතු ය"යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනිවර කියවා සම්මත කරන ලදී.

**10. අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

“පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය”යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සිට 5 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

“ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

“පනත් කෙටුම්පත දැන් තුන්වැනිවර කියවිය යුතු ය”යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනිවර කියවා සම්මත කරන ලදී.

**11. කර්මාන්තශාලා (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

“පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය”යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

“පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය”යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සිට 8 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

“ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

“පනත් කෙටුම්පත දැන් තුන්වැනිවර කියවිය යුතු ය”යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**12. කල් තැබීම (කහ වගාකරුවන් ආරක්ෂා කිරීමේ නිසි සැලැස්මක්) :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

''ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.35 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 5.22 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් 2021 ජනවාරි 06 බදාදා පූ.භා 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.